# බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

*ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191ක් ගත වී ඇති මේ මොහොතේ 19වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. අපි මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.*




# තල්, පොල් සහ මුතු පබා

4 වැනි කොටස

**ශ්‍රියා කුමාරසිංහ** නවසීලන්තයේ සිට



කොළඹ කොටුව 1900 දී

දසත සුපතල ලංකා දිවයිනෙහි අති නිර්'මලත්වය මගින් ආකර්ෂණය කරන ලදුව, එහි වැසියන් මිත්‍යා දෘෂ්ටිකත්වයෙන් මුදා උසස් ජීවන තලයකට නගා සිටුවනු වස්, ගෞතම බුදුන් වහන්සේ තුන් වතාවක් මෙම දිවයිනට වැඩම කර ඇත. ක්‍රිස්තු පූර්'ව 624දී උපත ලද, පසුව බුද්ධත්වයට එසේ නැතහොත් සියල්ල දත් ශාස්තෘවරයෙකුගේ තත්වයට පත් වූ මෙම ගෞතම හෙවත් ශාක්‍ය මුනි, නේපාල මායිමේ අයෝධ්‍යා නම් වු කුඩා රාජ්‍යයක සුද්ධෝදන නම් කුමරෙකුගේ පුතණුවන්ය. සුද්ධෝදන සිය පුතු ජීවිතයේ දුක් ගැහැට පිළිබඳ යතාර්ථ අවබෝධයෙන් වලකා ලනු වස් හැකි සෑම උපායක්ම යෙදූ මුත් ඒ සියල්ල නිශ්ප්‍රභා විය. ගෞතම බුදුන් වහන්සේ ලංකාවට පැමිණි පළමු වතාව සිහි ගැන්වීම සඳහා බින්තැන්නේ, නැතහොත් එවකට එම පෙදෙස හැඳින්වූ පරිදි මහායංගන හි අඩි සියයක උසින් සහ අඩි තුන්සිය හැටක වට ප්‍රමාණයෙන් යුතුව ගඩොලින් ඉදි කල විස්මිත දාගැබ සියවස් විස්සකට පසුවද තවම විරාජමානව පවතී. වර්ෂ 1602 දී සංචාරකයෙකු විසින් මෙම දාගැබ පිළිබඳව විස්තර කරමින්, එය කිසිදු අඩුපාඩුවකින් තොරව, ඉතා සූක්ෂම ලෙස මනහර වට රවුමකින් යුතුව තනා, දිළිසෙන සුදු පැහැයෙන් නිමවා, මුදුනෙහි පිරමීඩයක් බස්සවා සාදා ඇති බව කියයි. බින්තැන්නේ දැනට ඉතිරිව ඇත්තේ එකම එක පන්සලකි. දුගී පැල්පත් තිහකින් පමණ වටවීඇති එය උසින් අඩු, මැටියෙන් තනා සුදු හුණු පිරියම් කල, කිසිදු පෙනුමක් නැති ගොඩනැගිල්ලකි. පිටත බිත්තිය ජන ප්‍රවාද ආශ්‍රිතව අඳින ලද ගොරහැඩි චිත්‍ර වලින් වැසී ඇත. ඓතිහාසික සටහන් වලට අනුව එය ආදි කාලීන යක්ෂ ගෝත්‍රිකයින්ගේ රැස්වීම් පැවැත්වූ ස්ථානය වන මහානාක උයනින් වට වීතිබී ඇත.

තමාගේ පැමිණීමේ සිහිවටනයක් ලෙස ශ්‍රීපාද නොහොත් උතුම් වූ සිරිපා සළකුණ ආදම්ගේ කන්ද මුදුනෙහි රැඳවුයේ ගෞතම බුදුන් වහන්සේගේ තුන් වන සංචාරයේදීය. බුදුන් වහන්සේ ලංකාවට වැඩම කල බව ඇසූ දෙවියෙක් සිය රැකවලෙහි ඇති කන්ද මුදුනෙහි සිහිවටනයක් තබන මෙන් ඉල්ලා සිටියේය. රැස්ව සිටි දෙවිවරු මධ්‍යයේ සිට බුදු රජාණෝ නැගෙනහිර දිසාව බලා අඩි පහක් පමණ දිග පා සටහන තැබූ සේක. ලංකා දිවයින බුදුන් වහන්සේ ගේ උරුමයක් සේ පවතින බව සහ එහි උන් වහන්සේ දෙසූ දහම ප්‍රචලිත වන බව සංකේතවත් කරමින් මෙම පා සළකුණ නොමැකී පැවතුණි. ටෙනන්ට් මෙසේ කියයි. පසු කලෙක බ්‍රාහ්මණයන් විසින් කඳු මුදුනේ අටල්ලේ පිහිටි මෙම ලාංඡනය ශිව දෙවියන්ගේ පා සළකුණ යයි ද, බොදුනුවන් විසින් බුදුන්ගේ යයි ද, කිතුණුවන් විසින් ඊව් නැතහොත් යේසුස් ගේ පියාගේත් පියාගේ යයි ද, මහමදිකයින් විසින් ආදම්ගේ යයි ද කියු අතර පෘතුගීසීන් දෙකොටසකට බෙදී, එක් කොටසක් මෙම සළකුණ සාන්ත තෝමස්ගේ යයි ද, තවත් කොටසක් ඉතියෝපියාවේ රැජින ගේ යයි ද කියූහ. (සටහන 1)

ක්‍රි.පූ. 543 දී, හරියටම ගෞතම බුදුන් වහන්සේ අසූ වසක් ආයු වළඳා කුසිනාරාවේ සල් ගසක් යට පිරිනිවන් පෑ දින විජය ලක්දිවට ගොඩ බට තැන් පටන් දිවයිනේ විශිෂ්ට රජ පරපුරෙ අවසාන පුරුක වන මහසෙන් රජු ක්‍රි. ව. 301 දී මියගිය පුවත දක්වා වු සියළු ඓතිහාසික සිදුවීම් පාලි බසින් ලියු මහාවංශයේ පිටුවල සටහන් වීඇත. හතර වන සියවසේ ආරම්භයේ සිට පෘතුගීසි ආධිපත්‍යයේ අවසානයට ආසන්න වු 1758 තෙක් වු ඉතිහාසය, විවිධ රජවරුන්, කුලහීනයන් ආදීන් පිළිබඳ තොරතුරු, චූලවංශය සහ තවත් එවැනි තොරතුරු මූලාශ්‍ර වල සඳහන් වේ. මෙම ඉතිහාස කාව්‍යයේ පශ්චාත් භාගයේ අන්තර්ගත කරුණු දෙස බලන විට 16 වන සියවසේ සිටි අන්‍ය ලබ්ධිකයෙකු වු 1වන රාජසිංහ රජු අතින් එම ලියවිලි විනාශ නොවීරැකී තිබෙනු දැකීම පුදුම සහගතය. ඉහත කී මූලාශ්‍ර අනුසාරයෙන් වර්තමාන සියවස ආරම්භයේ බිරිතානින් විසින් දිවයින අත්පත් කර ගැනීම දක්වා වු අවුරුදු 2341 පුරා රට කරවු රජුන් 165කගේ නිරවද්‍ය එමෙන්ම අඛණ්ඩ විස්තරයක් ලබා ගත හැකිය.

මෙහිලා එම සියළු රජවරුන්ගේ විස්තර, යුද ආක්‍රමණ, විප්ලව ආදිය පිළිබඳ පුළුල් විස්තරයක් ගෙන ඒමට බලාපොරොත්තු නොවෙමි. මන්ද යත් ලංකා ඉතිහාසය ඉතා සරු එකක් බැවිනුත්, ඉන් බොහොමයක්ම ශිෂ්‍යයෙකුට විනා අන් අයෙකුට නීරස එකක් වීමට බොහෝ දුරට ඉඩ ඇති බැවිනුත්ය. එහෙයින් සාමාන්‍ය කියවන්නෙකුට සුදුසු යයි හැගෙන දෑ පමණක් කෙටියෙන් මෙහි දක්වමි. විජයගේ ආගමනය ගැන කලින් සඳහන් කළෙමි. ඔහු බෙංගාලයේ සිට සිය පියා විසින් පිටුවහල් කරන ලද කිසි වැදගැම්මකට නැති පුද්ගලයෙකි. සිංහල කුමාරිකාවක් සරණ පාවා ගෙන දේශීය නායකයින් මහා පරිමාණයෙන් ඝාතනය කරමින් සිය ආධිපත්‍යය තහවුරු කර ගත්තේය. අවුරුදු තිස් පහක ඇවෑමෙන් මරණාසන්න මොහොතේ රාජ්‍යය භාර ගැනීමට සිය බාල මළනුවන් වන පණ්ඩුවාස එවන මෙන් සිය පියාගෙන් ඉල්ලා යැව්වේය. ඒ ඉල්ලීමට අනුව, ගෞතම බුදුන්ගේ ඥාති සොහොයුරියක හා ආවාහ වීදිවයිනට පැමිණි පණ්ඩුවාස ක්‍රි.පූ.

